Article 12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019/07/19

පැමිණිලිකාරිය : එස්.එම්.සී. කුමුදුමාලි මිය.
අංක : 71/40, හේවාහැට පාර,
තල්වත්ත, මහනුවර.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පතිතුමිය,
මහමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

02. විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.
(සභාපති, අභියාචනා හා විරෝධතා මණ්ඩලය - මහමායා බාලිකා විදුහල, මහනුවර)

පැමිණිලි අංකය : **HRC/K/71/18 (W)**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලි පාර්ශවය 2018.01.30 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, වගඋත්තර පාර්ශවය මහ/මහමායා බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා (ආසන්නතා පදනමින්) අයදුම්පත් යොමුකර සම්මුඛ පරීක්ෂණයේදී තමන් විසින් පදිංචිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉඩම් බලපත්‍රය සඳහා ලබාදිය යුතුව තිබූ ලකුණු 06 ක ප්‍රමාණය අහිමි කරමින් තම දියණිය වන එච්.එම්.වයි. යොහාන්යා දියණිය පාසලට ඇතුළත් කර නොගත් බවයි.

පැමිණිලිකාරිය කැඳවුම් අංක ආර් 112 යටතේ මහමායා බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනීසිට ලකුණු 80 ක් ලබාගෙන ඇති අතර, එම ලකුණු ප්‍රමාණය 2018 වර්ෂයේ එම විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින්ද (මෙම පදනම යටතේ ශිෂ්‍යාවන් තෝරා ගැනීමට අදාළ කඩඉම් ලකුණු 82 ක් විය) ඒ සම්බන්ධයෙන් තමන් සෑහීමට පත් නොවූ බැවින්ද පැමිණිලි පාර්ශවය අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය හමුවේ අභියාචනාවක් ගොනු කළ බවත් නමුත්, එමගින්ද තමන් වෙත සාධාරණයක් ඉටු නොවූ බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

මෙහිදී පැමිණිලි පාර්ශවය වෙත පදිංචිය තහවුරු කිරීමට අදාළ ලකුණු අහිමි වී යාමට ප්‍රධාන හේතුව වී ඇත්තේ එම පාර්ශවය පදිංචි ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් හිමිකම් ඔප්පුවක් පැමිණිලිකාරිය සතු නොවීමත් ඒ සඳහා මහ/ගංගාරාම විහාරාධිපති හිමියන් විසින් ලබාදෙන ලද බලපත්‍රයක් පමණක් පැවතීමත්ය. කෙසේ වෙතත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් උක්ත බලපත්‍රය සඳහා ලකුණු ප්‍රධානය කිරීම ප්‍රතික්ෂේප කර ඇති අතර, පැමිණිලි පාර්ශවයේ පදිංචිය තහවුරු කිරීම සඳහා මෙම ඉඩමට අදාළව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය බව වගඋත්තර පාර්ශවය මෙහිදී දැනුම්දී ඇත.

කෙසේ වෙතත් පැමිණිලි පාර්ශවය දක්වන පරිදි මෙම ඉඩමට අදාළව වසර 20 ක පමණ සිට මහනුවර දිසා අධිකරණයේ නඩු අංක 815 යටතේ නඩු කටයුත්තක් විභාග වන අතර, ඉඩමෙහි ඔප්පුව ලබාගැනීමට හැකි වන්නේ එම නඩුව අවසන් වූ පසුව වන බව දක්වා ඇත. එබැවින් පැමිණිලි පාර්ශවය සම්මුඛ පරීක්ෂණයේදී සිය පදිංචියට අදාළව ඉදිරිපත් කර ඇත්තේ මහ/ගංගාරාම විහාරාධිපති හිමියන් විසින් ලබාදෙන ලද ලිපියක් වන අතර, එම ලිපියට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කිසිදු ලකුණක් ලබාදී නොමැත.

මෙම ඉඩමට අදාළව ඉඩම් කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රය ලබාගැනීම සඳහා උක්ත විහාරාධිපති හිමියන් විසින් ලබාදෙනු ලබන ලිපියක් අවැසි වන නමුත්, එම හිමිනම එකී ලිපිය ලබාදීම ප්‍රතික්ෂේප කරමින් ඉඩමට අදාළව පවරා ඇති නඩුව ඉල්ලා අස් කර ගතහොත් තමන් වහන්සේ එම ලිපිය ලබාදීමට කටයුතු කරන බවට පැමිණිලි පාර්ශවය වෙත දැනුම්දී ඇත.

තවද තමා ඉපිද ඇත්තේ, මෙම පදිංචියට අදාළ ඉඩමේ වන අතර වරිපනම්, ජල හා දුරකථන බිල්පත් පවා එම ඉඩමට ඇති බවත් ග්‍රාම නිලධාරී සහතික සහ නඩුවට අදාළ ලිපි ලේඛනද ඉදිරිපත් කළ නමුත් පැමිණිලි පාර්ශවයේ පදිංචිය තහවුරු කිරීමේදී වගඋත්තර පාර්ශවය එකී සියළු කරුණු බැහැර කර ඇති බවට දක්වා ඇත.

ඒ අනුව ඉඩමේ ඔප්පුවට සහ පදිංචිය තහවුරු කිරීමට අදාළ පැමිණිලිකාරියගේ දියණියට හිමිවීමට තිබූ ලකුණු 06 ක ප්‍රමාණය ලබානොදීමට වගඋත්තර පාර්ශවය කටයුතු කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පැමිණිලි පාර්ශවයේ උක්ත පැමිණිල්ල සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් ද සිදු කරන ලද විමසීමේදී වගඋත්තර පාර්ශවය මහ/මහමායා බාලිකා විද්‍යාලය සිය කරුණු දැක්වීම මගින් සඳහන් කර ඇත්තේ, පැමිණිලි පාර්ශවය මුල් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 80 ක් ලබාගෙන ඇති අතර, තාවකාලික ලේඛනයේ කඩඉම් ලකුණ ලකුණු 81 ක් වූ බැවින් පැමිණිලිකාරියගේ නම අවසන් නාම ලේඛනයට ඇතුලත් නොකිරීමට කටයුතු කර ඇති බවයි.

ආර් 112 යටතේ ආසන්නතා පදනම යටතේ කැඳවුම් ලබා ඇති මෙම පැමිණිලි පාර්ශවය සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු පහත පරිදි වේ.

| තිර්ණායක | සම්මුඛ පරීක්ෂණයේදී හිමි වූ ලකුණු |
|---|---|
| පදිංචිය | 30 |
| ආසන්නතාවය තහවුරු කර ලේඛන | 00 |
| පදිංචිය තහවුරු කරන ලේඛන | 05 |
| ආසන්න පාසැල් ගණන | 45 |
| මුළු ලකුණු | 80 |

මෙම පදනම යටතේ කඩඉම් ලකුණු 81 ක්ද, මෙම පැමිණිලි පාර්ශවය සම්මුඛ පරීක්ෂණයේදී හිමිව තිබුණේ ලකුණු 80 ක් බැවින් අදාළ දියණියගේ නම තාවකාලික ලේඛනයට ඇතුලත් කර නොමැති බවද දක්වා ඇත.

අනතුරුව පැවති අභියාචනායන්හි විරෝධතා පරීක්ෂණය සඳහා මෙම පැමිණිලි පාර්ශවය අභියාචයන් ද ගොනු කර තිබූ නමුත්, එහිදීද පදිංචිය සනාථ කිරීම සඳහා පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇත්තේ මහ/ගංගාරාම විහාරාධිපති හිමියන් විසින් ලබාදී තිබූ බලපත්‍රයක් වන බවත්, 22/17 චක්‍රලේඛනය අනුව එම ලේඛනය සඳහා පැමිණිලිකාරියට ලකුණු ප්‍රධානය කිරීමේ හැකියාවක් නොතිබූ බවත් වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් දන්වා ඇත.

මෙම ඉඩමෙහි පදිංචිය සනාථ කිරීම සඳහා පැමිණිලි පාර්ශවය සතුව නිශ්චිත හිමිකම් ඔප්පුවක් නොපැවති අතර, ඒ සඳහා ඉදිරිපත් කර තිබුණු උක්ත ලේඛනයද ප්‍රතික්ෂේප වීමෙන් මෙම

පැමිණිලිකාරියගේ දියණියට ආසන්නතාවය තහවුරු කරන ලේඛන සඳහා කිසිදු ලකුණක් ප්‍රධානය කිරීමට නොහැකි වූ බව වගඋත්තර පාර්ශවය සිය කරුණු දැක්වීමෙහිදී සඳහන් කර ඇත.

කෙසේ වෙතත්, ආසන්නතා පදනම යටතේ අවසන් නාම ලේඛනයේ කඩඉම් ලකුණ ලකුණු 82 ක් වීමෙන් පැමිණිලිකාරියගේ නම අවසන් නාමලේඛනයෙන් පොරොත්තු ලේඛනයට ඇතුලත් කළ බව වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් දක්වා ඇත.

නිරීක්ෂණ :-

දෙපාර්ශවයේම ලිඛිත සැලකිරීම් සැලකිල්ලට ගනිමින් 2018.02.08 දින මෙම පැමිණිල්ලට අදාළ මූලික විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සිදුකර ඇති අතර, එහිදී පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන සඳහා ලබා දී ඇති ලකුණු සාධාරණ වන මුත් උපතේ සිටම තමන් පදිංචිව සිටින මෙම පූජා භූමි ඉඩමේ පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් කිරීමට පැමිණිලි පාර්ශවයට නොහැකිව ඇත්තේ එම ඉඩම සම්බන්ධයෙන් නඩුවක් පැවතීමත් ගංගාරාම විහාරාධිපති හිමි විසින් ඉඩම් කොමසාරිස් වෙත යොමු කිරීමට අවැසි ලිපිය ලබාදීම උන්වහන්සේ ප්‍රතික්ෂේප කර තිබීමත් හේතුවෙන් බව නිරීක්ෂණය වී ඇත.

කෙසේ වෙතත්, අදාළ ලිපිනයේ තම පදිංචිය සනාථ කිරීමට අදාළ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමට නොහැකි වීමෙන් පැමිණිලි පාර්ශවයට දැඩි අසාධාරණයක් සිදුව ඇති බව විමර්ශනයේදී අනාවරණය වී ඇත.

කෙසේ නමුත් පැමිණිලි පාර්ශවයේ ඉල්ලීම අනුව බෞද්ධ කටයුතු කොමසාරිස් (ප්‍රාදේශීය කාර්යාලය - මහනුවර) විසින් 2018.02.26 දාතමින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ලිපියෙහි දැක්වෙන පරිදි එම නමින් ඉඩමක් ගංගාරාම විහාරය සතුව පවතින බවට තම කාර්යාලයේ පවතින ලේඛන මගින් තහවුරු වන බවත්, ග්‍රාම නිලධාරි වාර්තා අනුව පැමිණිලි පාර්ශවය උක්ත ඉඩමෙහි පදිංචිව සිටින බවට සඳහන් කර ඇති බවත් සඳහන් කර ඇත.

නිගමනය :-

ඉහත සියළු කරුණු දැක්වීම හා නිරීක්ෂණයන්ට අනුව, මෙම පැමිණිලි පාර්ශවයේ පදිංචිය සනාථ කිරීම සඳහා හිමිකම් ඔප්පුවක් ඉදිරිපත් කර නොමැති වීමට සාධාරණ හේතු පවතින බවත් (ඉඩම සම්බන්ධයෙන් නඩුවක් පැවතීම) එම පාර්ශවයේ ඉල්ලීම පරිදි ඉඩම් කොමසාරිස් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ලිපියද අනෙක් සියළු ලේඛනද වලංගු බවට පිළිගත හැකි ඒවා බවටත් කොමිෂන් සභාවේ නිගමනය වේ.

ඒ අනුව වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන මත සහ ග්‍රාම නිලධාරි වාර්තා අනුව පැමිණිලි පාර්ශවය මෙම ඉඩමෙහි පදිංචි බව තහවුරු වන බැවින් එම පාර්ශවයේ පදිංචිය සහ ආසන්නතාවය සනාථ වූ බව වගඋත්තර පාර්ශවය විසින් පිළිගෙන ඒ සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවයට හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය.

02. ඒ අනුව පැමිණිලිකාරියගේ දියණිය පදිංචිය, ආසන්නතාවය ඇතුළු සියළු සුදුසුකම් නිසි පරිදි සපුරන බවට නිරීක්ෂණය වන බැවින් එච්.එම්.වයි. යොහාන්යා දියණිය 2018 වර්ෂයේ වගඋත්තරකාර විද්‍යාලයේ පළමු ශ්‍රේණියට (2019 වර්ෂයේ දෙවන ශ්‍රේණියට) ඇතුළත් කර ගැනීමට කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.09.02 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No.14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No.14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත්: 1. ගරු අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

B/